# කලුතර අශෝකාරාම මහා විහාර බිතු සිතුවම්

**ඩබ්. එච්. රුක්ෂාන් ප්‍රියන්දන**

මුහුදු පුරාවිද්‍යා ඒකකය, කොටුව - ගාල්ල
priyandana@gmail.com

## හැඳින්වීම

කොළඹ ගාල්ල ප්‍රධාන මාර්ගයේ උතුරු කළුතර පොලිසිය අසල වන අශෝකාරාම විහාර මාවත ඔස්සේ ගමන්කර විහාරස්ථානයට ළඟා විය හැකි වේ. 19 වන සියවසේ අග භාගයේ ඉදිවූ විහාරස්ථානයක් වන මෙය බිහිකිරීමේ මූලික පියවර ගනු ලැබුවේ වැල්අරුමගේ එලියස් ප්‍රනාන්දු නම් පුද්ගලයාය. අශෝකාරාම විහාර සිතුවම් හේතූන් කිහිපයක් නිසා වටිනාකමක් හිමිවේ. ඒ අතර ප්‍රධාන වන්නේ සමකාලීන සමාජ පැතිකඩ ශිල්පියා දැනුවත්ව හෝ නොදැනුවත්ව නිරූපනය වීමයි. එසේම ඉතා විශාල පරාසයක් පුරාවට ජාතක කතා පමණක් නිරූපනය කර තිබීමයි.

## අන්තර්ගතය

එවකට ප්‍රදේශයේ විහාරස්ථානයක් නොතිබූ බැවින් අළුත්ගම සංඝරතන හිමියන් එතනමඩල ප්‍රදේශයේ කළුගිග අසල නා ගස් කැල්ල නම් ස්ථානයේ කුඩා පැල්පතක් සාදා නැවතී පිඬුසිගා වඩිමින් සිට ඇත. උන්වහන්සේ කළුතර නොයෙක් ප්‍රදේශවලින් පැමිණි ජනතාවට ධර්මානුශාසනා කරන්නට විය. පසුව එලියස් ප්‍රනාන්දු මහතා විසින් කිථතර දේශශාස්ත්‍ර හී පිහිටි "කට්ටි පහ" නැමති ඉඩමෙහි ශාලාවක් සාදා සෑම පෝයකටම එහි ධර්මදේශනා සිදු කිරීමට කටයුතු කරන ලදී. ධර්මානුශාසනා ඇසීමට පැමිණෙන අය ක්‍රමයෙන් වැඩිවෙත්ම මුලින් තැනූ ධර්ම ශාලාවෙහි ඉඩ පහසුකම් මදි විය. පසුව වැල්අරුමගේ එලියස් ප්‍රනාන්දු නොහෙත් රේන්ද මහතා නමින් ප්‍රසිද්ධව සිටි ඔහු ධර්ම ශාලාව විශාල කර ඉදිකිරීමත් සමග එම ස්ථානය ධර්ම ශාලාව ලෙස ප්‍රසිද්ධියට පත්වන්නට විය. අනතුරුව ප්‍රදේශ වාසීන් එහි කුඩාවට පිළිම ගෙයක් සාදා වන්දනාමාන සිදු කරන ලදී. එලියස් ප්‍රනාන්දු මහතා එවකට කලු ගග හරහා තිබූ පාලමින් එගොඩ වන ගැල් වලින් බදු එකතුකරනු ලැබූ පුද්ගලයාය. මොහුට රේන්ද මහතා යන නම පටබැඳුනේ ද මෙකී හේතුව නිසාවෙනි. ස්වකීය ධන පරිත්‍යාගයෙන් විහාර මන්දිරයක් ඉදිකිරීමට හෙතෙම ඉදිරිපත් විය. මේ සියලුම ඉදිකිරීම් සිදහා එලියස් ප්‍රනාන්දු මහතා වැයකළ මුදල රන් පවුම් 3650කි. (සෝමාරාම; 1968, 9).

විහාර මන්දිරය නිමකිරීම හා සඝ සතුකොට පූජා කිරීම පිළිබඳව ගල් පුවරුවක් විහාර මන්දිරයට ඇතුළුවන ස්ථානයේ සවිකර තිබේ. මේ අනුව බු.ව 2411 දී එනම් ක්‍රි.ව. 1868 දී විහාර පූජාව මාතර ධර්මාරාම මහා ස්වාමීන් වහන්සේ ප්‍රමුඛ මහා සංඝයාට පූජා කල බව දැක්වෙයි. පසුකලෙක විහාර පාලනය මාතර අමරපූර සද්ධර්මවංශික නිකායික පූජ්‍ය අලුත්ගම සංඝරතන හිමියන් ප්‍රමුඛ ශිෂ්‍ය සංඝරත්නයට පවරන ලදී.

ගර්භයකින්, අන්තරාලයකින්, ප්‍රදක්ෂිණාපතයකින් හා දොරටු මණ්ඩපයකින් යුක්තව විහාර මන්දිරය නිමවා ඇත. උසින් අඩි 65 ද දිගින් අඩි 67 ද පළලින් අඩි 65 ද සිටින සේ නිමකරන ලද විහාර මන්දිරයේ ලන්දේසි ගෘහ නිර්මාණ ශිල්පයේ ආභාෂය දැකිය හැක. ගර්භයේ දොළොස් රියන් සැතපෙන බුද්ධ ප්‍රතිමාවක්ද, දොලොස් රියන් හිටි පිළිමයක් හා අට රියන් ඔත් පිළිමයක්ද ඇත. ගර්භ ගෘහයේ ශ්‍රාවක රූ සිත්තම්වලට අමතරව සොළොස්මස්ථාන දක්වන සිතුවම්ද වේ. පිට මාලයේ සූවිසි විවරණය හා ඉදිරිපස මකර තොරණ රූප ඇඹීම කරනු ලැබ තිබේ.

විහාර මන්දිරයේ බුද්ධ ප්‍රතිමා හී සිවුරේ රැලි නිමවා තිබෙන ස්වභවය සුවිශේෂ වේ. උඩරට සම්ප්‍රදායේ ලක්ෂණවලින් මිදී සිවුරේ රැලි ඇගට ඇලී ඇති අයුරින් නිමවා තිබේ. මෙවැනි ලක්ෂණ සහිත බුදු පිළිම සමකාලීන විහාරහී දැකගත නොහැක. විහාර මන්දිරය ආලින්දයකින් ද පිටමාලයකින් ද අන්තරාලයකින් හා ගර්භ ගෘහයකින්ද සමන්විතය. ගර්භ ගෘහයට ඇතුල්වීමට ප්‍රධාන දොරටු දෙකකි එහි ඉහල බ්‍රිතාන්‍ය සලකුණ දැක්වේ. ගර්භ ගෘහයට ඇතුළු වන දොරටු දෙකට ඉහලින් මකර තොරණ දෙකක් නිමවා ඇත. මකර තොරණට ඉහල බිත්තියපූරාවට මාර පරාජය දක්වන සිතුවම නිරූපිත වේ.

පිට මාලයේ ඇතුල් බිත්ති තුළ (දකුණු, පිටුපස, වම්) සූවිසි විවරණ බුද්ධ ප්‍රතිමා ඇඹීම සිදුකර තිබේ. මාලකයේ වම්පස බිත්තිපූරාවටම වෙස්සන්තර ජාතකකතාව නිරූපිතය. මාලකයේ පිටුපස බිත්තියේ තේලපත්ත ජාතකය දකුණු පස සිට වම් පස දක්වා ඉහල තීරුව මුලුල්ලේම ගලාගෙන යයි බිත්තියේ ජනෙල් කවුලු 04 ක් දක්නට තිබෙන අතර ජනෙල් කවුළු දෙකක් අතර කොටසේ පහලට ගලායන ආකාරයට උයදහද්ද, කට්ඨහාරී හා මනිචෝර යන ජාතතකකතා සිත්තම් කරයි.

පිටමාලයේ දකුණු බිත්තිය මැද ජනෙල් කවුළුව අසල සිට වම් පසටත් දකුණු පසටත් ජාතක කතා ගලා යයි. කවුළුවේ සිට වම්පසට සස ජාතකය, ධර්මපාල ජාතකය, ශාන්තිවාදී ජාතකතය, සාම ජාතතකය යන කතා පුවත් චිත්‍රනය කර තිබෙන අතර දකුණු පසට දිවෙන ජාතක කතා ආරම්භ වන්නේ ඉදිරිපස බිත්ති කොටසිනි. එහි දහම් සෝඩ හා පංචායුධ යන කතාවස්තු ඇත. බිත්තියේ මැද ජනෙල් කවුලුව අසලින් සීලනාග හා සිවි ජාතකය නිරූපිත සිත්තම් වම් පසට ගලා යයි. සිවිලිම මුලුල්ලේම නැකැත් රූප, චන්ද්‍ර මාස සහ ලග්න සලකුණු සිතුවම් කර ඇත.

අශෝකාරාම සිත්තරා සමස්ත විහාර චිත්‍ර කර්මාන්තය තුළම තම විශේෂ අවධානය යොමුකර තිබෙනුයේ වෙස්සන්තර ජාතක කතාවටය. තීරූ 05 ක් යටතේ නිර්මාණය කර තිබෙන බිත්ති හී තීරුවක පළල අගල් 25 1/2 කි. වෙස්සන්තර ජාතකය නිරූපනය අවසන් වන්නේ පහළම තිරුවේ මැද භාගයෙනි. කලුතර ප්‍රදේශය වසර ගණනාවත් මුලුල්ලේම බටහිර ආදිපත්‍යට යටත් වීම තුළ ජනතාව තුළින් පිරිහෙමින් යමින් තිබුනා වූ දන්දීමේ උතුම් ගුණය මෙනෙහි කරදීම උදෙසා මෙකී ජාතක කතාව සමකාලීන විහාරස්ථාන යන්හී මෙන්ම මොහුද තේමාකර ගත්හ. වෙස්සන්තර ජාතකයෙන් තරම් භාවාතිෂය හැඟීම් උද්දීපනයට සමත් වෙනත් ජාතක කතාවක් නොමැති තරම්ය. මේ හේතුව නිසාදෝ සිත්තරුන්ගේ වැඩි අවධානයක් මේ සඳහා යොමුවී ඇත. ජාතක කතාව සිදුවීම් 48 ඔස්සේ ගලායාමට සලස්වා තිබේ.

අශෝකාරාම විහාර සිත්තරා සමස්ථ සිතුවම් සිදහා තේමාකර ගනු ලැබ තිබෙනුයේ ජාතක කතා පමණි. පහතරට විහාර සිත්තරුන් බොහෝවිට බුද්ධ චරිතයද තම සිතුවම්හී අන්තර්ගතයට යොදා ගත්හ. එකී න්‍යායට බැහැරව යමින් තම අභිමතය පරිද තේමාවන් සොයාගිය අවස්ථාවක් ලෙසට අශෝකාරාම විහාර සිතුවම් හැදින්විය හැකිවේ. මහනුවර සම්ප්‍රධායේ සිතුවම් බුද්ධි ගෝචර ස්වභාවයකට වඩා අක්ෂි ගෝචර කලාවක් ලෙසින් වර්ධනය විය. (ලක්දුසිංහ; 1990, 113) මෙකී අක්ෂිගෝචර ස්වභාවය එලෙසින්ම යොදා ගනිමින් ඒ සඳහා බුද්ධි භාවයද සාධනීය මට්ටමකට ළිගාකරගත් සිතුවම් සහිත විහාරස්ථානයක් ලෙසින් අශෝකාරාමය හැඳින්විය හැකිවේ.

යටත් විජිත සමයේ වවිධ වූ ක්‍රියාකාරකම් මත ප්‍රදේශයේ සමාජ තලය වෙනස්විය. අශෝකාරාම විහාර සිතුවම් මිගින් එසේ විනාශ වූ සමාජයේ බොහෝ තැන් පෙන්වා දිය හැකි ජාතකකතාවන් තම වස්තු විෂය කර ගත්හ. එසේම එවක සමාජයේ තමන්ට නිතරම නෙත ගැටුණු, තම ජන විඥාණයට සමීප වූ දේ ශිල්පියාගේ තෙළි තුඩින් නොදනුවත්වම නිරූපණය වන ලදී. වෙස්සන්තර ජාතක කතාවේ වෙස්සන්තර රජු ගේ දන්හලකින් පුද්ගලයකු සොරකම් කරන ආකාරය නිරූපිත අතර ශිල්පියා එකී පුද්ගලයා විරූපීව හා නිරුවත්ව දක්වා එවැනි ක්‍රියා ගර්හාවට ලක්කර ඇත.

## නිගමනය

අශෝකාරාම විහාර සිතුවම් ශෛලිය දෙස බැලීමේදී කෝට්ටේ විහාර හා හොරණ උඩුව විහාර සිතුවම් ශෛලිය හා සමීපතාවයක් දැකිය හැක (ප්‍රියන්දන; 2012, 104). මිනිස්

රූ නිර්මාණයේදී නිරන්තරයෙන්ම චලන රූපීව එහි ජීවී ගුණය කැටිකරමින් චිත්‍රණය කිරීමට සිත්තරා සමතව ඇත. තමන් ජාතකකතාව ඔසසේ ගෙනයාමට උත්සාහ කරන පණිවුඩය හුදක් රූපමය ප්‍රකාශයකින් පමණක් නොව භාවාතිශය හැගීම් ඔස්සේ සම්ප්‍රේෂණය කිරීමට හෙතෙම සමත් වෙයි. මෙසේ දේශීය හා විදේශීය සමාජ තලයේ ආභාසය ලබමින් සම්මිශ්‍රණය වූ පහත රට සිතුවම් කලාවේ වර්ධනීය අවස්ථාවක් ලෙස අශෝකාරාම විහාර සිතුවම් හැදින්විය හැකිවේ.

### ආශ්‍රෙය ග්‍රන්ථ

ප්‍රියන්දන, රුක්ෂාන්; 2012, පිටපතින් පමණක් දැකියහැකි මහ උඩුව සිරි සුනන්දාරාමයේ සිතුවම්, ජාතික පුරාවිද්‍යා සමුලුව 2012.

ලක්දුසිංහ, සිරිනිමල්; 1990, චිත්‍ර කලාව - පුරාවිද්‍යා දෙපාර්තමේන්තු ශත සංවත්සරය, රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව, කොළඹ

සෝමාරාම ස්ථවීර, වල්ගම් එළියේ; 1968, උතුරු කිථතර අශෝකාරාම මහ විහාර පුරාවෘතය, අනුලා මුද්‍රණාලය, ඩික්සන් පාර, කොළඹ - 10.